# ගනුදෙනුකාර ගිවිසුම

ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ සමාගමක් ලෙස, (ලියාපදිංචි අංක **PB228**) අවසර ලත් ප්‍රාථමික නියෝජිත සමාගමක් වන, කොළඹ 03 ධර්මපාල මාවත අංක 53, 4 වන මහල දරන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි ලිපිනය පිහිටා ඇති HNB සෙකියුරිටීස් ලිමිටඩ් සමාගම (මින් මතුවට මෙහි 'නියෝජිත' යනුවෙන් හැඳින්වෙනු ඇති අතර, එමගින් එහි අනුප්‍රාප්තිකයන් සහ ලැබුම්කරුවන් ද අදහස් වේ) සහ ……………………………………………………………………..…………………………… දරන ලිපිනයේ පදිංචි …………………………………………………………………………… (ජා.හැ.ප. අංක/සමාගම් ලියාපදිංචි කිරීමේ අංක ………..……… දරන) ……………………………………………………………………..…………………… යන අය (මින් මතුවට මෙහි 'ගනුදෙනුකරු' යනුවෙන් හැඳින්වෙනු ඇති අතර, එම යෙදුම මගින් එහි අනුප්‍රාප්තිකයන් සහ ලැබුම්කරුවන් ද අදහස් වේ) යන අය අතර මෙම ගිවිසුම ඇතිකරගන්නා ලද්දේ වර්ෂ ………………. දින දී ය.

**නියෝජිත සමාගම** - භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ වෙනත් මහ බැංකු සුරැකුම්පත් වැනි රජයේ සුරැකුම්පත් මෙන්ම අනාගතයේ දී හඳුන්වා දීමට ඉඩ ඇති ව්‍යුත්පන්න මෙන්ම සමාගමේ දැනට පවතින හෝ අනාගතයේ හඳුන්වා දිය හැකි සැලසුම් රාශියට අයත් වන වෙනත් සැලසුම් බෙදාහැරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කරන ලද ප්‍රාථමික නියෝජිත සමාගම.

**ගනුදෙනුකරු** - නියෝජිත සමාගම හරහා යම් සැලසුමක් හෝ යම් සේවාවක් මිලදී ගන්නා හෝ අලෙවි කරන හෝ අත්පත් කරගන්නා හෝ බැහැර කරන හෝ ඒ සම්බන්ධයෙන් යම් බැඳියාවක් පවතින හෝ, එවැනි සැලසුම් හෝ සේවාවන් අත්පත් කරගැනීමට හෝ බැහැර කිරීමට හැකියාවක් ඇති හෝ ඒ සම්බන්ධයෙන් බැඳියාවක් ඇති, නියෝජිත සමාගම සමග ගනුදෙනු කරන යම් තැනැත්තෙකු හෝ ආයතනයක් වන අතර, අදාළ සන්දර්භයට අනුව එවැනි ගනුදෙනුකරුවෙකුගේ හෝ එවැනි ගනුදෙනුකරුවෙකුගේ තත්ත්වයේ නෛතික නියෝජිතයෙකු වන අතර, පහත සඳහන් කර ඇති පොදු කොන්දේසි වලට යටත් ව සිදුකෙරෙනු ඇත.

**පොදු කොන්දේසි**

1. හැඳින්වීම

   ගනුදෙනුකරු සහ බැංකුව/ ප්‍රාථමික නියෝජිත සමාගම (සාමූහිකව "නියෝජිත සමාගම" අතර සිදුවන ඕනෑම ගනුදෙනුවකට මෙම පොදු කොන්දේසි අදාළ වනු ඇති අතර, යම් විශේෂ ගනුදෙනුවකට අදාළව ඇති විශේෂ කොන්දේසි මගින් අනුපූරණය කරනු ලැබිය හැකි අතර,

යම් ගැටුමක් මතු වූ අවස්ථාවක එවැනි විශේෂ කොන්දේසි මෙම පොදු කොන්දේසි වලට ඉහළින් බලපැවැත්වෙනු ඇත.

2. බලය

(a) මෙහි දක්වා ඇති මෙන්ම විශේෂිත කොන්දේසි වල දක්වා ඇති නීතිරීති හා කොන්දේසි වලට අනුකූලව නියෝජිත සමාගම විසින් නිර්ලේඛන සුරැකුම්පත් සහ පොලී රඳවා ගැනීම සඳහා සුරැකුම් ගිණුම් විවෘත කර පවත්වාගෙන යනු ඇත.

(b) නිසි ලෙස බලය ලත් තැනැත්තෙකු වෙතින් නියෝජිත සමාගම වෙත ලිඛිත දැන්වීමක් හෝ එය විසින් පිළිගනු ලබන වෙනත් දැන්වීමක් ලැබෙන තෙක් සහ නියෝජිත සමාගමට ඒ මත ක්‍රියා කිරීමට සාධාරණ කාලසීමාවක් (එම කාලසීමාවට පසුව එම වෙනස්වීම මත විශ්වාසය තැබීමට) ලැබෙන තෙක් (පහත දක්වා ඇති) සන්නිවේදනයන් යැවීම සඳහා හෝ වෙනත් ඕනෑම දෙයක් සිදුකිරීම සඳහා, නිර්ලේඛන සුරැකුම් පියවීමේ පද්ධතියෙහි ගනුදෙනුකරුවන් සමග ඍජුව සම්බන්ධ වන සහභාගී වන්නන්ට අදාළ වන පද්ධති රීති වලට යටත්ව, ගනුදෙනුකරු විසින් නම් කරන ලද එක් එක් තැනැත්තාගේ බලාධිකාරිය මත නියෝජිත සමාගම විසින් විශ්වාසය තබනු ඇත.

(c) නියෝජිත සමාගම විසින් ගනුදෙනුකරුගේ විශේෂ උපදෙස් රහිතව විශේෂිත කොන්දේසි වල හඳුනාගෙන ඇති යම් යම් ගනුදෙනු සිදුකරනු ඇත.

(d) නියෝජිත සමාගම විසින්ගනුදෙනුකරු වෙත හිමිකම පවතින නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පත් මත කල්පිරීමේ දී ලැබෙන ආදායම සහ නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පත් වලින් සිදුකරණ ගනුදෙනු වල ආදායම ලබාගනු ඇත.

(e) නියෝජිත සමාගම විසින් ගනුදෙනුකරුගේ සුරැකුම් ගිණුමක පවතින දෝෂ සහගත හර හෝ බැර නිවැරදි කරනු ඇති අතර, එවැනි නිවැරදි කිරීම් සම්බන්ධයෙන් ගනුදෙනුකරු දැනුවත් කරනු ඇත.

3. සන්නවේදන

අන්‍යාකාරයකට එකග වී නොමැති නම්, ගනුදෙනුකරු හෝ නියෝජිත සමාගම හෝ අනෙක් තැනැත්තා වෙත ලිඛිතව, ෆැක්ස් මගින් හෝ නියෝජිත සමාගමට පිළිගත හැකි යම් විද්‍යුත් සන්නිවේදන ක්‍රමවේදයක් මගින් උපදෙස් ලබා දෙනු ඇත. ගනුදෙනුකරු විසින් එවැනි සන්නිවේදන වල මූලය තහවුරු කරගැනීමට හැකි වන ආකාරයට සකස් කළ, එකඟ වූ යම්

ආරක්ෂක කාර්යපටිපාටියකට අනුකූලව ක්‍රියා කරනු ඇති අතර, ගනුදෙනුකරු විසින් ඒට අනුකූලව කටයුතු නොකිරීමෙන් නියෝජිත සමාගමට සිදුවිය හැකි යම් හානියක් හෝ පාඩුවක් සම්බන්ධයෙන් නියෝජිත සමාගම වන්දිපූරණය කළ යුතුය.

4. කාර්යසාධනය

(a) නියෝජිත සමාගම විසින් ප්‍රාථමික නියෝජිත කර්මාන්තයේ පරිචයන් සහ ප්‍රමිතීන්ට අනුකූලව සද්භාවයෙන් සහ සාධාරණ අවධානයෙන් යුතුව ගනුදෙනු සම්බන්ධයෙන් සිය වගකීම් ඉටුකරනු ඇත.

(b) අනුකූලතාව දක්වමින් ක්‍රියා කළ යුතු වනවිට, යම් නීතියක්, රෙගුලාසියක් හෝ රජයේ හෝ වෙනත් අධිකාරියක වෙනත් නියමයක් කඩ වීමක් සිදුවිය හැකි වන යම් ගනුදෙනුවක් පිළිබඳ ස්වකීය වගකීම් ඉටු කිරීමට නොහැකි වීම සම්බන්ධයෙන් ගනුදෙනුකරු හෝ නියෝජිත සමාගම හෝ වගකීමට බැඳී නොසිටියි.

5. ගනුදෙනුකරුගේ තොරතුරු

(a) සුරැකුම් ගිණුම් විවෘත කර, පවත්වාගෙන යාම පිණිස සහ ගනුදෙනු සිදුකිරීම සඳහා නියෝජිත සමාගම විසින් සාධාරණ ලෙස ඉල්ලා සිටින සියලුම ලේඛන සහ වෙනත් තොරතුරු ගනුදෙනුකරු විසින් නියෝජිත සමාගම වෙත සැපයිය යුතු අතර, එම තොරතුරු වල යම් වෙනසක් සිදු වුවහොත් නියෝජිත සමාගම වෙත වහාම දැනුම් දීමට ගනුදෙනුකරු භාරගනියි.

(b) ගනුදෙනුකරුට අදාළ තොරතුරු නියෝජිත සමාගම විසින් රහස්‍ය ලෙස පවත්වාගත යුතු අතර, කෙසේ වුව,ද එම තොරතුරු හෙළිදරව් කිරීමට ගනුදෙනුකරු කැමැත්ත පළ කරන්නේ නම් හෝ නියෝජිත සමාගමෙහි දත්ත සැකසුම් සිදුකරන යම් තෙවන පාර්ශ්වයක් වෙත හෝ එම තොරතුරු හෙළිදරව් කරනු ලැබීමට නීතියෙන් හෝ යම් අධිකරණ නියෝගයකින් හෝ නියම කරනු ලබන්නේ නම් නියෝජිත සමාගම විසින් එම තොරතුරු හෙළිදරව් කරනු ලැබිය හැකිය.

6. වගකීම් සහ වන්දිපූරණය

(a) යම් වක්‍ර හෝ ආනුෂංගික හෝ ප්‍රතිවිපාක හානියක් හෝ පාඩුවක් සම්බන්ධයෙන් නියෝජිත සමාගමට හෝ ගනුදෙනුකරුට කිසිදු වගකීමක් නොපවතිනු ඇත.

(b) නියෝජිත සමාගමෙහි පාර්ශ්වයෙන් හෝ එහි සේවකයෙකු හෝ නියෝජිතයෙකු හෝ අතින් සිදුවන නොසැලකිලිමත්කමක් හෝ පැහැර හැරීමක් මත සිදුවුවහොත් හැර, ගනුදෙනුකරුට දරන්නට සිදුවන යම් පාඩුවක් සඳහා නියෝජිත සමාගම වෙත වගකීමක් නොපවතිනු ඇත.

(c) නියමිත වටිනාකම් දිනයට නියෝජිත සමාගම වෙත මුදල් පියවීම ද ඇතුළත්ව නමුත් ඊට සීමා නොවී, පොදු කොන්දේසි සහ විශේෂිත කොන්දේසි වලට අනුකූලව සපයන ලද ගනුදෙනුකරුගේ උපදෙස් ක්‍රියාත්මක කිරීම මගින් උද්ගත වන යම් පාඩුවක් හෝ වගකීමක් සඳහා සහ, එසේ කිරීමට අපොහොසත් වීමේ ප්‍රතිඵලයක් ලෙස නියෝජිත සමාගමට ඇතිවන යම් පාඩුවක් සඳහා නියෝජිත සමාගම වන්දිපූරණය කිරීමට ගනුදෙනුකරු එකඟ වේ.

(d) ගනුදෙනුකරු තනි පුද්ගලයෙකුට වැඩි පුද්ගල සංඛ්‍යාවක් නම්, අදාළ සියලුම තැනැත්තන් ගනුදෙනුකරු ලෙස සැලකෙනු ඇති අතර, ඔවුන් එක්ව සහ වෙන් වෙන්ව නියෝජිත සමාගම වෙත වගකිව යුතු වනු ඇත.

7. ගාස්තු, බදු සහ අයකිරීම්

(a) නියෝජිත සමාගම විසින් ගනුදෙනුකරු වෙත සපයනු ලබන යම් ගාස්තු ලැයිස්තුවක දක්වා ඇති ගාස්තු සහ අයකිරීම් ගනුදෙනුකරු විසින් නියෝජිත සමාගම වෙත ගෙවිය යුතුය. නියෝජිත සමාගම විසින් සිය අභිමතය පරිදි ගාස්තු සහ අයකිරීම් අතහරිනු ලැබිය හැකිය;

(b) ගනුදෙනුකරු හා නියෝජිත සමාගම අතර සිදුකරනු ලබන හෝ ගනුදෙනුකරු වෙනුවෙන් නියෝජිත සමාගම විසින් සිදුකරන යම් ගනුදෙනුවක් මත පනවනු ලබන සියලුම බදු, අයකිරීම් සහ තීරුබදු සඳහා නියෝජිත සමාගමට දරන්නට සිදුවන සියලු වියදම් ගනුදෙනුකරු විසින් නියෝජිත සමාගම වෙත ගෙවිය යුතුය.

8. ලියම සහ පියවීම්

(a) ගනුදෙනුකරු වෙතින් නියෝජිත සමාගමට අය විය යුතුව හිඟ ව පවතින සියලුම මුදල් පියවනු ලබන තෙක් ගනුදෙනුකරුට අයත් සියලුම මුදල්, තැන්පතු සහ සුරැකුම් මත ලියමක් ක්‍රියාත්මක කිරීමේ අයිතියට නියෝජිත සමාගම හිමිකම් ලබනු ඇත

(b) ගනුදෙනුකරු වෙතින් නියෝජිත සමාගම වෙත ලැබිය යුතුව පවතින මුදල් පියවා ගැනීම සඳහා, යම් ගිණුමක ගනුදෙනුකරුගේ බැරට පවතින මුදල් යොදවා පියවීමට සහ අත්පත් කරගැනීමට ඇති අයිතිය ක්‍රියාවේ යෙදවීමට නියෝජිත සමාගම හිමිකම් ලබනු ඇත.

9. ගනුදෙනු තහවුරු කිරීම් සහ ගනුදෙනුකරුගේ ගිණුම් ප්‍රකාශන

(a) ගනුදෙනුකරු වෙනුවෙන් එළඹෙන ලද එක් එක් ගනුදෙනු සඳහා ලිඛිත තහවුරු කිරීමක් නියෝජිත සමාගම විසින් යවනු ඇත.

(b) විද්‍යුත් ආකාරයෙන් හෝ තැපැල් මගින් කාලීන ගිණුම් වාර්තා ලබාගැනීම සඳහා ගනුදෙනුකරු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දී ඇති පහසුකම් භාවිත කළ යුතුය. ඊට අමතරව, එම කාර්යය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයා ඇති පහසුකම් හරහා ගනුදෙනුකරුට ස්වකීය ගනුදෙනු වල තත්ත්වය නැරඹීමට හැකියාව පවතී.

(c) තහවුරු කිරීම් වල හෝ නියෝජිත සමාගම හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති ගිණුම් ප්‍රකාශන වල පවතින යම් වරදක් වේ නම්, එම ගිණුම් ප්‍රකාශනය හෝ තහවුරු කිරීම ලැබීමෙන් දින 14ක් තුළ ගනුදෙනුකරු විසින් නියෝජිත සමාගම වෙත ලිඛිතව දැනුම්දිය යුතුය.

(d) කල්පිරීමේදී ලැබෙන ආදායම් වලට අදාළව අවම වශයෙන් එකී කල්පිරීමට ලිත් දින හතකට හෝ පෙර උපදෙස් ලබා දීමට ගනුදෙනුකරු එකඟ වේ. කල්පිරීමෙන් ලැබෙන ආදායම් සම්බන්ධව කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධව නියෝජිත සමාගම වෙත කිසිදු උපදෙසක් ලැබී නොමැති නම්, එවිට නියෝජිත සමාගම විසින් ගනුදෙනුකාර ගිවිසුමට අනුකූලව එම ආදායම් ඊට පෙර ගනුදෙනුවට අදාළ කාලසීමාව ඉක්මවා නොයන කාලයක් සඳහා නැවත ආයෝජනය කරනු ඇත.

10. දැන්වීම්

මෙම ගිවිසුම ප්‍රකාරව ලබාදිය යුතු දැන්වීම් යැවිය යුතු වන තැනැත්තන්ගේ නම් සහ තනතුරු, ඔවුන්ගේ ලිපිනයන්, ෆැක්ස් අංක සහ දුරකථන අංක සහ අදාළ වන්නේ නම් ඊමේල් ලිපිනයන් ද සමග නියෝජිත සමාගම සහ ගනුදෙනුකරු විසින් එකිනෙකාට දැනුම් දිය යුතුය. ඉහත දක්වා ඇති ආකාරයෙන් යම් වෙනස්වීමක් සම්බන්ධයෙන් දැනුම් දීමක් ලැබෙන තුරු සහ ක්‍රියා කිරීමට සාධාරණ කාලයක් (ඉන් පසුව එම වෙනස්වීම සම්බන්ධයෙන් විශ්වාසය තබා කටයුතු කිරීමට) ලැබෙන තුරු ගනුදෙනුකරු සහ නියෝජිත සමාගම විසින් ඉහත කී පරිදි ලබාදෙනු ලබන තොරතුරු මත විශ්වාසය තබනු ඇත.

11. පැමිණිලි විසඳීම

ගනුදෙනුකරු වෙතින් ලැබී ඇති යම් පැමිණිල්ලක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රාථමික නියෝජිත සමාගම් වෙත නිකුත් කර ඇති ගනුදෙනුකාර ගිවිසුමෙහි 14 වගන්තියෙහි දක්වා ඇති පැමිණිලි විසඳීමේ ක්‍රමවේදයට අනුව නියෝජිත සමාගම විසින් විසඳිය යුතුය.

12. සංශෝධන

ගනුදෙනුකරු වෙත සපයනු ලබන සේවාවන් වල යම් සංශෝධනයක්, වෙනස් කිරීමක් සම්බන්ධයෙන් මාසයකට නොඅඩු දැනුම් දීමක් නියෝජිත සමාගම විසින් ගනුදෙනුකරු වෙත සැපයිය යුතුය.

13. සන්නිවේදන භාෂාව

නියෝජිත සමාගම විසින් කටයුතු කිරීමට කැමති භාෂාව වන්නේ ඉංග්‍රීසි භාෂාවයි. විකල්ප වශයෙන් ගනුදෙනුකරු විසින් නියෝජිත සමාගම සමග එළඹීමට නියමිත යම් ගනුදෙනුවකට අදාළ යම් තොරතුරක්/ ලේඛනයක් සිංහල භාෂාවෙන් හෝ දමිළ භාෂාවෙන් හෝ තමා වෙත සපයන ලෙස ගනුදෙනුකරු විසින් ඉල්ලා සිටිය හැකිය.

14. අදාළ වන නීතිය

නියෝජිත සමාගම සෑම අවස්ථාවකදී ම ස්වකීය වගකීම් යුතුකම් සහ කටයුතු ඉටු කිරීමේ දී සහ ගනුදෙනුකරු වෙත සේවාවන් සැපයීමේ දී අදාළ ලිඛිත නීතියට අනුකූලව කටයුතු කළ යුතුය.

ඊට සාක්ෂි පිණිස මෙම ලේඛනයේ පළමු පිටුවේ සඳහන් කර ඇති ක්‍රියාත්මක වීමේ දින සිට බලපැවැත්වෙන පරිදි මෙහි පහත සඳහන් කර ඇති අදාළ දිනයන් හි දී පාර්ශ්වකරුවන් මෙම ලේඛනයට අත්සන් තබන ලදී.

| | |
|---|---|
| අත්සන් කළේ : ………………………………. | අත්සන් කළේ: ……………………………. |
| නම: …………………..…………… | නම: ………………….……………… |
| පදවිය: …………………………….. | පදවිය: …………………………….. |
| දිනය: ………………..…………….. | දිනය: ……………….…………….. |

*[ගනුදෙනුකරු තනි පුද්ගලයකු වූ විට]*

අත්සන(අත්සන්): …………………..………….. ……………………………..……………..

නම: …………………………… නම: ……………………………

සාක්ෂි: ………….……………… (නම): ………….………………

සාක්ෂි: ………….……………… (නම): ………….………………

දිනය: …………………………….. දිනය: ……………………………..

*[ගනුදෙනුකරු සංස්ථාපිත සමාගමක් වූ විට]*

කොළඹ දී සීමාසහිත …………………………… සමාගමේ මුද්‍රාව තබන ලද්දේ සහ අධ්‍යක්ෂකවරුන් විසින් අත්සන් තබන ලද්දේ අධ්‍යක්ෂ …………..…………...…….. සහ අධ්‍යක්ෂ …………..…………...…….. ඉදිරිපිටදීය.

<u>සාක්ෂිකරුවන්</u>

1.

2.

හෝ

............................................ සමාගමේ බලයලත් අත්සන්කරු විසින් කොළඹදී අත්සන් කරන ලදී.

අත්සන

<u>සාක්ෂිකරුවන්</u>

1.

2.

දිනය: ……………………………..